# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2038/15 - 2017 සැප්තැම්බර් මස 25 වැනි සඳුදා - 2017.09.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1979 අංක 51 දරන වරාය අධිකාරිය පනත**

දැන්වීමයි

1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනතේ දෙවන (2) වගන්තියේ තුන්වන (3) උප වගන්තිය ප්‍රකාරව වරාය හා නාවික අමාත්‍යවරයා විසින් කරනු ලබන නියෝගය

මහින්ද සමරසිංහ,
වරාය හා නාවික කටයුතු අමාත්‍ය.

2017 සැප්තැම්බර් 25 වෙනි දින,
කොළඹ දී ය.

**නියෝගය**

2007 ජනවාරි මස 17 වන දින අංක 1,480/7 හා 2008 ඔක්තෝම්බර් මස 20 වන දින අංක 1572/6 දරන අතිවිශෙෂ ගැසට් පත්‍ර වල සඳහන් හම්බන්තොට වරාය සීමාව පිළිබඳව පළ කොට ඇති නියෝග මෙයින් අවලංගු කොට එකී වරායේ සීමාවන් පහත උපලේඛනයේ සඳහන් පරිදි වේ.

***ගොඩබිම් සහ ජල ප්‍රදේශයේ සීමාවන් පිළිබඳ උපලේඛනය***

*ගොඩබිම් ඉඩම් ප්‍රදේශ සීමාවන්*

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාගම් පත්තුව සුළු කොට්ඨාශයේ මිරිජ්ජවිල ආරබොක්ක, කරිවිල, කොහොලන්කල සහ හම්බන්තොට ගම් සීමාවන් තුල පිහිටි ලියාපදිංචි බලයලත් මිනින්දෝරු එස්. ආර්. ඉලේපෙරුමාච්චි විසින් පිළියෙල කළ අංක ඕපී/එස් /278 සහ 2017 .07. 24 දාතම දරන පිඹුරුපතේ සඳහන් පහත දැක්වෙන නම්, විස්තර සහ ප්‍රමාණයන්ගෙන් යුතු ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් සහ එහි පාලනය යටතේ පවතින අනන්‍ය භාවිතයේ හා භුක්තියේ ඇති පහත පරිදි විස්තර කර ඇති ගොඩබිම් ප්‍රදේශ සීමාවන් හෙවත් කැබලි අංක,

*ගොඩබිම් ඉඩම් ප්‍රදේශ සීමාවන් (සම්බන්ධිතයි)*

1. කැබලි අංක 1 - මිරිජ්ජවිල කැලේ, මේජර්ගේ වත්ත, ගල්වක්කඩ, ලේවාය එගොඩහ, ඉදිවින්න, නෙලුම්පත් විල සහ ආරබොක්ක කැලේ යන ඉඩම්වල හෙක්ටයාර 961 .7460 ක වපසරියකින් යුක්ත වූ කොටසට මායිම් ‍:

*උතුරට* : රජයට අයත් ආරබොක්ක කැලේ, ලේවාය එගොඩහ සහ සිප්පිකුලම
*නැගෙනහිරට* : රජයට අයත් ලේවාය එගොඩහ, සිප්පිකුලම, කරගන්ලේවාගොඩැල්ල සහ මේජර්ගේ වත්ත නැමැති පුද්ගලික ඉඩම
*දකුණට* : රජයට අයත් කරගන්ලේවාගොඩැල්ල, එකී පිඹුරේ කැබලි අංක 6 සහ කැබලි අංක 3, මුහුද, එකී පිඹුරේ කැබලි අංක 5 සහ රජයට අයත් මිරිජ්ජවිල කැලේ
*බටහිරට* : රජයට අයත් මිරිජ්ජවිල කැලේ, අඩි 100 පාර (මහා මාර්ගය), රජයට අයත් රණවිරු ගම, කජුවත්ත සහ ආරබොක්කකැලේ

2 . කැබලි අංක 2 - කෘතිම දූපත මිරිජ්ජවිල කැලේ යන ඉඩම්වල හෙක්ටයාර 42.2407 ක වපසරියකින් යුක්තවූ කොටසට මායිම් ‍:

*උතුරට* : මුහුද සහ එකී පිඹුරේ කැබලි අංක 5
*නැගෙනහිරට* : එකී පිඹුරේ කැබලි අංක 5 සහ මුහුද
*දකුණට* : මුහුද
*බටහිරට* : මුහුද

3. කැබලි අංක 5 - බටහිර දිය කඩනය යන ඉඩමේ හෙක්ටයාර 4. 9500 ක වපසරියකින් යුක්තවූ කොටසට මායිම් ‍:

*උතුරට* : එකී පිඹුරේ කැබලි අංක 1 සහ මුහුද
*නැගෙනහිරට* : මුහුද
*දකුණට* : මුහුද සහ එකී පිඹුරේ කැබලි අංක 2
*බටහිරට* : මුහුද, එකී පිඹුරේ කැබලි අංක 2 සහ කැබලි අංක 1

4. කැබලි අංක 6 - නැගෙනහිර දිය කඩනය යන ඉඩමේ හෙක්ටයාර 3. 2449 ක වපසරියකින් යුක්තවූ කොටසට මායිම් ‍:

*උතුරට* : එකී පිඹුරේ කැබලි අංක 1 සහ මුහුද
*නැගෙනහිරට* : මුහුද
*දකුණට* : මුහුද
*බටහිරට* : මුහුද

5 කැබලි අංක 7 - නේවි දිය කඩනය යන ඉඩමේ හෙක්ටයාර 0. 8022 ක වපසරියකින් යුක්තවූ කොටසට මායිම් ‍:

*උතුරට* : රජයට අයත් මේජර්ගේ වත්ත සහ මුහුද
*නැගෙනහිරට* : මුහුද
*දකුණට* : මුහුද
*බටහිරට* : මුහුද

6 කැබලි අංක 8 - වැලි දිය කඩනය යන ඉඩමේ හෙක්ටයාර 1. 1110 ක වපසරියකින් යුක්තවූ කොටසට මායිම් ‍:

*උතුරට* : රජයට අයත් මිරිජ්ජවිලකැලේ සහ මුහුද
*නැගෙනහිරට* : මුහුද
*දකුණට* : මුහුද
*බටහිරට* : මුහුද

*ජල ප්‍රදේශ සීමාවන්*

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාගම් පත්තුව සුළු කොට්ඨාසයේ මිරිජ්ජවිල, ආරබොක්ක, කරිවිල, කොහොලන්කල සහ හම්බන්තොට ගම් සීමාවන් තුළ පිහිටි ලියාපදිංචි බලය ලත් මිනින්දෝරු එස්. ආර්. ඉලේපෙරුමාච්චි විසින් පිළියෙල කළ අංක ඕපී/එස් /278 සහ 2017 .07. 24 දාතම දරන පිඹුරු පතේ සඳහන් පහත දැක්වෙන නම්, විස්තර සහ ප්‍රමාණයන්ගෙන් යුතු ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් සහ එහි පාලනය යටතේ පවතින, එහි අනන්‍ය භාවිතයේ හා භුක්තියේ ඇති පහත පරිදි විස්තර කර ඇති ජල ප්‍රදේශ සීමාවන් හෙවත් කැබලි අංක,

*ගොඩබිම් ඉඩම් ප්‍රදේශ සීමාවන් (සම්බන්ධිතයි)*

7. කැබලි අංක 3 - ඇතුළු වරාය යන ජල ප්‍රදේශයේ හෙක්ටයාර 147. 6265 ක වපසරියකින් යුක්තවූ කොටසට මායිම් :

*උතුරට* : එකී පිඹුරේ කැබලි අංක 1
*නැගෙනහිරට* : එකී පිඹුරේ කැබලි අංක 1
*දකුණට* : මුහුද, එකී පිඹුරේ කැබලි අංක 4 සහ කැබලි අංක 1
*බටහිරට* : එකී පිඹුරේ කැබලි අංක 1

8. කැබලි අංක 4 - ප්‍රධාන ඇළ මාර්ගය යන ජල ප්‍රදේශයේ හෙක්ටයාර 26. 4207 ක වපසරියකින් යුක්තවූ කොටසට මායිම් :

*උතුරට* : එකී පිඹුරේ කැබලි අංක 3 සහ මුහුද
*නැගෙනහිරට* : මුහුද
*දකුණට* : මුහුද
*බටහිරට* : මුහුද, එකී පිඹුරේ කැබලි අංක 1 සහ කැබලි අංක 3

10-285

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.